කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 37

මගේ අංකය:- ඩීඑම්එස් /ප්‍රසාද දීමනා/01/2007
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2007.12.13

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන් / රාජ්‍ය සංස්ථා හා
සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සභාපති වරුන් වෙත,

## රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයින්ට 2007 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් ගෙවීම.

රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයින්ට 2007 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් පහත සඳහන් පරිදි ගෙවීමට මෙයින් අනුමැතිය දෙනු ලැබේ.

1. වාර්ෂික ප්‍රසාද මුදලට අමතර වශයෙන් පැමිණීම හා සම්බන්ධ කොට ගත් දිරිකාරක හෝ වෙනත් දිරිකාරක ගෙවන්නේ නම්, එවැනි ලාභ ලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයින්ට වාර්ෂික ප්‍රසාද මුදල රු. 7,500/- කි.

2. ලාභ උපයාගෙන ඇති එහෙත් දැනට දිරිකාරක ගෙවනු නොලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයින්ට වාර්ෂික ප්‍රසාද මුදල රු. 10,000/- කි.

3. පාඩු ලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයින්ට රු. 1000/- ක ප්‍රසාද මුදලක් පමණක් ගෙවීමට අවසර දෙනු ලැබේ. එහෙත් , එම අවසරය දෙනු ලබන්නේ පවත්නා වර්ෂය(2007) සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් තරම් අරමුදල් ආයතනය සතුව ඇත්තේ නම් පමණි.

4. ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය සේවකයින් හට ගෙවා ඇති විටෙක එම ගෙවීම අතිරේක ප්‍රසාද මුදලක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇත්නම් මිස එයද වර්ෂ අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

5. යථෝක්ත ප්‍රමාණයන්ගෙන් බැහැරවීම අවශ්‍ය වන්නාවූ කිසියම් අවස්ථාවක් ඇතිවුවහොත් එය අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයද සමග අධ්‍යයනය කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

6. ඉහත පරිදි ප්‍රසාද මුදල් ගෙවීම සඳහා, අදාල රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල වාර්ෂික ගිණුම් 2002.05.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: පීඒ/පීඊ/21 ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට මත්තෙන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

7. ප්‍රසාද මුදල් ගෙවීම සඳහා අරමුදල් කිසිවක් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

8. වෙනත් විධිමත් අනුමැතියක් මත ප්‍රසාද දීමනා ගෙවනු ලබන ආයතන සඳහා මෙම චක්‍රලේඛයේ විධි විධාන අදාළ නොවේ.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති
4. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්

} දැ.ගැ.ස. සහ අ.ක.ස.